1 පත්‍රයට අදාළ පසුගිය විභාග ගැටළු

**10 ශ්‍රේණිය**

**1 වන පාඩම - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

## අ.පො.ස.(සා.පෙළ) 2016

1. මධ්‍යම සැකසුම් ඒකකයෙහි රික්ත නාල ට්‍රාන්සිස්ටර් මගින් ද, ඉන් අනතුරුව ට්‍රාන්සිස්ටර් අනුකලිත පරිපථ මගින් ද ප්‍රතිස්ථාපනය වීමේ ප්‍රතිඵලය වූයේ කුමක් ද?
   (1) සැකසුම් බලය සහ විදුලිබල පාරිභෝජනය යන දෙක ම ඉහළ යාම
   (2) සැකසුම් බලය ඉහළ යාම සහ විදුලිබල පාරිභෝජනය පහළ බැසීම
   (3) සැකසුම් බලය පහළ බැසීම සහ විදුලිබල පාරිභෝජනය ඉහළ යාම
   (4) සැකසුම් බලය සහ විදුලිබල පාරිභෝජනය යන දෙක ම පහළ බැසීම

2. පහත දැක්වෙන වගන්ති සලකන්න:
   A - දුරකථනය මගින් සම්බන්ධ වී ශිෂ්‍යයෙකු වෛද්‍යවරයකුගෙන් වෛද්‍ය උපදෙස් ලබා ගනී.
   B - ස්වයංකරණය කරන ලද පද්ධතියක් ආර්ද්‍රතාව සහ උෂ්ණත්වය පදනම් කර ගනිමින් හරිතාගාරයක ඇති පැළෑටිවලට ජලය මුදාහරියි.
   C - ගුරුවරයෙකු ශ්‍රී ලංකාවේ විකිණීමට නොමැති පොතක් මාර්ගගත පොත් හලකින් මිලදී ගනියි.
   තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විධිමත් ලෙස භාවිත වන්නේ ඉහත කුමකින් ද?
   (1) A සහ B පමණි (2) A සහ C පමණි (3) B සහ C පමණි (4) A, B සහ C සියල්ල ම

## අ.පො.ස.(සා.පෙළ) 2017

3. පහත සිද්ධි සලකා බලන්න:
   A - උප්පැන්න සහතිකයක මුල් පිටපතෙහි පිටපතක් මාර්ගගතව (online) ලබා ගැනීම
   B - ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ජල බිල්පත් මාර්ගගතව ගෙවීම
   C - වාහනයක් සඳහා ආදායම් බලපත්‍රය මාර්ගගතව ලබා ගැනීම
   ඉහත සඳහන් කවරක් e-රාජ්‍ය සේවා හා සම්බන්ධ වන්නේ ද?
   (1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ලම

## අ.පො.ස.(සා.පෙළ) 2018

4. පුද්ගලයෙකු තම බැංකු ATM කාඩ්පත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකට ඇතුල කොට තම පුද්ගලික හැඳුනුම් අංකය (pin code) යන්ත්‍රයට ලබා දෙයි. අනතුරුව ඔහු ලබා ගත යුතු මුදලේ අගය යන්ත්‍රය වෙත ලබා දේ. ඔහුගේ ගිණුමේ පවතින ශේෂය පිරික්සීමෙන් අනතුරුව ATM යන්ත්‍රය මගින් මුදල් ලබා දීම, ශේෂය යාවත්කාලීන කිරීම හා නව ශේෂය දැක්වීම සිදු කරයි.
   ඉහත සංසිද්ධියට අදාළව 'ආදානයක්','ක්‍රියාවලියක්', හා 'ප්‍රතිදානයක්' පිළිවෙළින් දක්වා ඇත්තේ පහත කවරකද?
   (1) ලබාගත යුතු මුදල, නව ශේෂය, මුදල්
   (2) ලබාගත යුතු මුදල, ශේෂය යාවත්කාලීන කිරීම, නව ශේෂය
   (3) නව ශේෂය, පුද්ගල හැඳුනුම් අංකය, ලබාගත යුතු මුදල
   (4) ශේෂය යාවත්කාලීන කිරීම, පුද්ගල හැඳුනුම් අංකය, නව ශේෂය

5. පරිගණක තාක්ෂණයේ පළමු පරම්පරාවේ සිට නූතන පරම්පරාව දක්වා පරිණාමයේදී පහත සඳහන් කුමක් සිදු වීද?

A - පරිගණකවල සැකසුම් හැකියාව (processing power) වැඩි වීම

B - මධ්‍ය සැකසුම් ඒකකය තුළ (CPU) වර්ග සෙන්ටිමීටරයක ඇති ට්‍රාන්සිස්ටර් සංඛ්‍යාව වැඩි වීම

C - පරිගණකවල ආචයන ධාරිතාව (storage capacity) වැඩි වීම

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

6. e - රාජ්‍ය සේවාවක් සඳහා උදාහරණයක් **නොවන්නේ** පහත කවරක් ද?

(1) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල ලබා ගැනීම

(2) මාර්ගගත (online) සාප්පුවකින් අයිතම මිලදී ගැනීම

(3) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ජාතික හැඳුනුම්පත් අයදුම්පත්‍රය බාගැනීම (downloading)

(4) ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ජල බිල්පත් මාර්ගගතව ගෙවීම

## අ.පො.ස.(සා.පෙළ) 2019

7. පරිගණක පරම්පරා සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි වන්නේද?

(1) අනුකලිත පරිපථ (IC) හඳුන්වාදෙනු ලැබූයේ පළමුවන පරම්පරාවේ පරිගණකවලය.

(2) රික්තක නළ (vacuum tubes) හඳුන්වාදෙනු ලැබූයේ දෙවන පරම්පරාවේ පරිගණකවලය.

(3) ට්‍රාන්සිස්ටර් හඳුන්වාදෙනු ලැබූයේ තුන්වන පරම්පරාවේ පරිගණකවලය.

(4) අති විශාල පරිමාණයේ අනුකලිත පරිපථ (VLSI) හඳුන්වා දෙනු ලැබූයේ සිව්වන පරම්පරාවේ පරිගණකවලය.

8. පහත සඳහන් ඒ අතුරෙන් කුමක් ශ්‍රී ලංකාවේ G2C (රජයෙන් පුරවැසියන්ට) සේවා හා බැඳී පවතී ද?

A - අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල මාර්ගගතව බැලීම

B - මාර්ගගතව ආහාර වර්ග ඇනවුම් කිරීම

C - වාහන ආදායම් බලපත්‍ර මාර්ගගතව අලුත් කිරීම

(1) A පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම

## අ.පො.ස.(සා.පෙළ) 2020

9. තොරතුරු පද්ධතියක ප්‍රධාන කාර්ය තුන වන්නේ,

(1) ආදානය, සැකසීම සහ ප්‍රතිදානයයි.

(2) කේතනය, සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමයි.

(3) සැලසුම, සංවර්ධනය සහ පරීක්ෂාවයි.

(4) තෝරා ගැනීම, පිටපත් කිරීම සහ ඇලවීමයි.

10. පරිගණක පරම්පරා සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කවර වගන්තිද?

A. පළමු පරම්පරාවේ පරිගණකවල ට්‍රාන්සිස්ටර හඳුන්වා දී ඇත.

B. දෙවැනි හා තුන්වැනි පරිගණක පරම්පරාවල උසස් මට්ටමේ ක්‍රමලේඛ භාෂා භාවිතා කර ඇත.

C. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් (GUI) සහිත මෙහෙයුම් පද්ධති හතරවැනි පරම්පරාවේ පරිගණකවල භාවිත කර ඇත.

(1) A හා B පමණි.

(2) A හා C පමණි.

(3) B හා C පමණි.

(4) A, B හා C සියල්ලම.

11. කමලසිරි රජයේ වෙබ් නාමාවලිය සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල බිහිදොරට (http://www.gov.lk) ප්‍රවේශ වේ. කමලසිරි, ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල බිහිදොරින් ලබා ගන්නේ පහත සඳහන් කුමන සේවාවද?

(1) G2B　　(2) G2C　　(3) G2E　　(4) G2G

අ.පො.ස.(සා.පෙළ) 2021

12. පහත සඳහන් කුමක් භාවිතකරුවෙකුගේ දත්ත සැකසුම් කාර්යයකට උදාහරණයක් වේ ද?

(1) පුද්ගල පරිගණකයකට වදන් සැකසුම් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම
(2) පුද්ගල පරිගණකයක දෘඪ ඩිස්කය හැඩ සවි (formatting) ගැන්වීම
(3) වෙබ් අතරික්සුවක් භාවිත කර මාර්ගගත (online) පුවත්පතක් පුවත්පතක් කියවීම
(4) ශිෂ්‍යයකු ලබාගන්නා ලද සාමාන්‍ය ලකුණු පැවරුම් පතක් භාවිතයෙන් ගණනය කිරීම

13. ශ්‍රී ලංකා රජයේ නිල වෙබ් ද්වාරය (http://www.gov.lk) වෙත ක්‍රිෂ්ණා පිවිසෙන්නේ මාර්ගගත ක්‍රමයට ඇයගේ වාහන ආදායම් බලපත්‍රය නැවත අලුත් කර ගැනීමට ය. ඇය විසින් ලබාගන්නා ලද්දේ පහත සඳහන් කුමන සේවාවක් ද?

(2) G2B　　(2) G2C　　(3) G2E　　(4) G2G

අ.පො.ස.(සා.පෙළ) 2022

නැත.

පිළිතුරු

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) 2 | (2) 3 | (3) 3, 4 | (4) 2 | (5) 4 | (6 ) 2 | (7) 4 |
| (8) 2 | (9) 1 | (10) 3 | (11) 2 | (12) 4 | (13) 2 | |